# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1979 අංක 10 දරන වෛද්‍ය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1979 පෙබරවාරි මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරනා ලදී.

---

1979 පෙබරවාරි මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල: ශත 30 යි. තැපැල් ගාස්තුව: ශත 25 යි.

පාර්ලිමේන්තුවේ පුස්තකාලය
1979 -3- 5
ශ්‍රී ලං ම.

# 1979 අංක 10 දරන වෛද්‍ය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 පෙබරවාරි මස 9 වන දින]

එල්. ඩී.—ඕ. 44/78.

**වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1979 අංක 10 දරන වෛද්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෛද්‍ය ආඥාපනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. *105 වන අධිකාරයේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(ආආආ) ඇපොතිකරිවරයන් වශයෙන් ඩිප්ලෝමා ; ".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. *ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) (ඇඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇඇ) මේ වගන්තියේ (2අ) වන උපවගන්තිය යටතේ වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇත්තකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබුවාවූ ද, ඒ උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන ලේඛනයෙහි තත්කාලයේ නම දැක්වෙන්නා වූ ද යම් වතු ඇපොතිකරිවර යෙක් හෝ ඇපොතිකරිවරයෙක් ;" සහ

(ආ) (ඇඇ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇඇඇ) මේ වගන්තියේ (2ආ) වන උපවගන්තිය යටතේ වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇත්තකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබුවා වූ ද ඒ උපවගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ලේඛනයෙහි තත්කාලයේ නම දැක්වෙන්නා වූ ද යම් ආණ්ඩුවේ ඇපොතිකරිවර යෙක් ;"

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) ආණ්ඩුවේ සේවයේ සිටින්නා වූ හෝ ආණ්ඩුවේ සේවය අවසන් කරනු ලැබ ඇත්තා වූ හෝ යම් ආණ්ඩුවේ ඇපොතිකරිවරයකු, තමා—

(අ) යටත් පිරිසෙයින් සමස්තයක් වශයෙන් අවුරුදු පහ ලොවක කාලයක් ඇපොතිකරිවරයකු වශයෙන් රජයේ සේවයෙහි යෙදී සිටින බවට හෝ යෙදී සිටි බවට ද ;

2—ජ 38813—11,400 (79/2)

(ආ) ඒ කාලය ඇතුළත, යටත් පිරිසෙයින් සමස්තයක් වශයෙන් අවුරුදු දෙකක කාලයක් ආරෝග්‍යශාලා එකක හෝ වැඩි ගණනක එක් වෛද්‍ය වෘත්තිකයකු හෝ වෛද්‍ය වෘත්තිකයන් වැඩිදෙනකු යටතේ සේවය කරන බවට හෝ සේවය කර ඇති බවට ද;

(ඇ) ඇපොතිකරිවරයකු වශයෙන් ස්වකීය කාර්ය කාර්යක්ෂම ලෙස සහ සතුටුදායක ලෙස ඉටු කරන බවට හෝ ඉටු කර ඇති බවට ද,

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ විට, නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු රෙජිස්ට්‍රාර්වරයා විසින් වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇත්තකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

මේ වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තන්ගේ ලේඛනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු අතර මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ වෛද්‍ය සභාව විසින් මකා හැරිය යුතු යයි නියම කරනු ලැබූ යම් තැනැත්තකුගේ නම එයින් මකා හරිනු ලැබිය යුතු ය.

විෂමාචාරය පිළිබඳ වරදකරු වූ ආණ්ඩුවේ ඇපොතිකරිවරයකුට, ඒ විෂමාචාරයෙන් පසු, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා යහපත් හැසිරීමෙන් යුක්තව සිටි බවට අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වන්නේ නම්, මේ උපවගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

මේ උපවගන්තියේ සහ (2අ) වන උපවගන්තියේ කාර්ය සඳහා "රජයේ සේවය" යන්නට, ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ප්‍රාග්ධනය සපයනු ලැබූ සංස්ථාවක් යටතේ වූ සේවය ද ඇතුළත් වේ.";

(3) ඒ වගන්තියේ (2අ) වන උපවගන්තියෙහි (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) යම් වතු ඇපොතිකරිවරයකු හෝ ඇපොතිකරිවරයකු විසින්—

(i) (අ) වතු ඇපොතිකරිවරයකු වන්නා වූ ඔහුට, වතු ඇපොතිකරිවරයකු වශයෙන් යටත් පිරිසෙයින් සමස්තයක් වශයෙන් අවුරුදු පහළොවක කාර්යක්ෂම සහ සතුටුදායක සේවා කාලයක් තිබෙන බවට; නැත හොත්

(ආ) ඇපොතිකරිවරයකු වන්නා වූ ඔහුට, වත්තක ඇපොතිකරිවරයකු වශයෙන් හෝ වත්තක සහ රජයේ සේවයෙහි ඇපොතිකරිවරයකු වශයෙන් යටත්

පිරිසෙයින් සමස්තයක් වශයෙන් අවුරුදු පහළොවක කාර්යක්ෂම සහ සතුටුදායක සේවා කාලයක් තිබෙන බවට ; සහ

(ii) ඒ කාලය තුළ, යටත් පිරිසෙයින් සමස්තයක් වශයෙන් අවුරුදු දෙකක කාලයක් ආරෝග්‍ය ශාලා එකක හෝ වැඩි ගණනක එක් වෛද්‍ය වෘත්තිකයකු හෝ වෛද්‍ය වෘත්තිකයන් වැඩි දෙනකු යටතේ සේවය කර ඇති බවට,

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා සෑහීමකට පත්වන පරිදි සාධක ඉදිරිපත් කොට නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු රෙජිස්ට්‍රාර්වරයා විසින් වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇත්තකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.";

(4) ඒ වගන්තියේ (2අ) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2ආ) (අ) ආණ්ඩුවේ සේවයේ සිටින්නා වූ හෝ ආණ්ඩුවේ සේවය අවසන් කරනු ලැබ ඇත්තා වූ හෝ යම් ආණ්ඩුවේ ඇපොතිකරිවරයකු, තමාට—

(i) ආණ්ඩුවේ ඇපොතිකරිවරයකු ලෙස සමස්තයක් වශයෙන් අවුරුදු අටක කාර්යක්ෂම සහ සතුටුදායක සේවා කාලයක් තිබෙන බවට ; සහ

(ii) ඒ කාලය තුළ, යටත් පිරිසෙයින් සමස්තයක් වශයෙන් අවුරුදු තුනක කාලයක්, දිසා හෝ ප්‍රාදේශීය ආරෝග්‍යශාලා එකක් හෝ වැඩි ගණනකට එක් වෛද්‍ය වෘත්තිකයකු හෝ වෛද්‍ය වෘත්තිකයන් වැඩි දෙනකු යටතේ සේවය කර ඇති බවට ; සහ

(iii) විද්‍යාලයීය සභාව විසින් පිරිනමන ලද ඩිප්ලෝමාවක් ඇති බවට,

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ විට නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු රෙජිස්ට්‍රාර්වරයා විසින් වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇත්තකු වශයෙන් ලියා පදිංචි කරනු ලැබිය හැකි ය.

(ආ) මේ උපවගන්තිය යටතේ ලියා පදිංචි කරනු ලැබූ තැනැත්තන් පිළිබඳ ලේඛනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වා ගෙන යා යුතු අතර (3) වන උපවගන්තිය යටතේ මකා හැරිය යුතු යයි වෛද්‍ය සභාව විසින් නියම කරන ලද යම් තැනැත්තකුගේ නම එයින් මකා හරිනු ලැබිය යුතුය"; තවද

(5) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය පරිච්ඡින්න කොට ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) එසේ වුවද (1) (ආ) වන උපවගන්තිය යටතේ හෝ (1) (ඇ) වන උපවගන්තිය යටතේ හෝ (1) (ඇඇ) වන උපවගන්තිය යටතේ හෝ (1) (ඇඇඇ) වන උප වගන්තිය යටතේ හෝ වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇති ඇපොතිකරිවරයකු වන නැතහොත් (1) (ඈ) වන උපවගන්තිය යටතේ වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇති වතු ඇපොතිකරිවරයකු වන යම් තැනැත්තකු, රෝගියකුට ප්‍රතිකාර කිරීමේ දී අකාර්යක්ෂමතාව හෝ නොසැලකිල්ල පිළිබඳව වරදකරු බව හෝ ඔහු වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට නුසුදුසු බව පෙන්නුම් කරන්නා වූ ආකාරයේ හැසිරීමක් පිළිබඳව වරදකරු බව හෝ වෛද්‍ය සභාව සෑහීමට පත්වන පරිදි පෙන්නුම් කර දෙනු ලැබූ අවස්ථාවක, එම තැනැත්තා, මේ වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති වරප්‍රසාද හා පරිහාර ලැබීමෙන් ස්ථිර විශයෙන් හෝ නියමයෙහි සඳහන් කාලයක් තුළ අත්හිටවිය යුතු බවට නියමයක් වෛද්‍ය සභාව විසින් කරනු ලැබිය හැකි අතර, අවශ්‍ය වූ විට, අවස්ථාවෝචිත පරිදි, (2) වන උපවගන්තිය හෝ (2අ) වන උපවගන්තිය හෝ (2ආ) වන උපවගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ඇපොතිකරිවරයන්ගේ ලේඛන යෙන් යම් තැනැත්තකුගේ නම මකා හැරිය යුතු බවට නියමයක් ද කරනු ලැබිය හැකි ය.".